2020 වර්ෂයේ මැයි මාසයේදී ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ කොන්සියුලර් සේවාවන් සැපයීම

වර්තමානයේ ලොව පුරා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන **COVID**-19 වසංගත තත්වය හේතුවෙන් ශ්‍රී ලංකා විදේශ දූතමණ්ඩල සඳහා සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාව අතර වෛරසය පැතිරීම පාලනය කිරීම සඳහා, 2020 මාර්තු මස 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල වලින් ඉටු කෙරෙන (කොන්සියුලර්) රාජකාරීන් සීමා කිරීමට ශ්‍රී ලංකා විදේශ සබඳතා අමාත්‍යාංශය විසින් තීරණය කර ඇත.

ඒ අනුව ප්‍රංශ රජය විසින් ජනතාව සඳහා පනවා ඇති නීතීන් ලිහිල් කිරීමේ වැඩ පිළිවෙලේ පළමු අදියරට අනුකූලව, ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය කොන්සියුලර් සේවාවන් සඳහා පහත දැක්වෙන දිනයන් හිදී පමණක් විවෘතව තැබීමට තීරණය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

2020 මැයි 11 වන සඳුදා

2020 මැයි 13 වන බදාදා

2020 මැයි 18 වන සඳුදා

2020 මැයි 20 වන බදාදා

2020 මැයි 27 වන බදාදා

ඒ අනුව ඉහත දිනයන්හිදී පහත දැක්වෙන දුරකථන අංක වෙත අමතා හෝ **SMS** මගින් වෙන්කරවාගත් වේලාවන් අනුව මහජනතාවගේ සියළු සේවා සැපයෙනු ඇත.

<u>රාජකාරී වේලාවන් තුළදී (පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා)</u>

පොදු දුරකථන අංක: - **+33 1 55 73 31 31**

-**+33 6 77 04 81 17**

<u>රාජකාරී වේලාවෙන් අනතුරුව (ප.ව. 5.00 න් පසුව සහ සති අන්ත/ නිවාඩු දින වල)</u>

ගමන් බලපත්‍ර - **+33 6 20 97 70 90**

උපත්/ද්විත්ව පුරවැසි ලියාපදිංචිය - **+33 6 05 58 14 84**

වෙනත් කොන්සියුලර් සේවා - **+33 7 68 84 61 92**

ඔබගේ අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා කළින් දින වෙන්කරවා ගැනීමට සහ ඒ සම්බන්ධ **තොරතුරු** ලබා ගැනීමට ඉහත දුරකථන අංක සමග ඇමතුම් මාර්ගයෙන් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ **වියයුතුය**.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ප්‍රංශය